"සුවබර දිවියකට සනීපාරක්ෂාව"

# සනීපාරක්ෂාව පිළිබඳ ෂඪ වන දකුණු ආසියා සමුළුවේ (SACOSAN) ජාතික වැඩමුළුව




ශ්‍රී ලංකාවේ පවත්වන සනීපාරක්ෂාව පිළිබඳ 4 වන දකුණු ආසියා සමුළුව (SACOSAN IV) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ජල සම්පාදන සහ ජලාපවාහන අමාත්‍යාංශය මූලිකව සංවිධානය කිරීමේ කටයුතු සිදු කරමින් සිටී. සාර්ක් රටවල සනීපාරක්ෂාව පිළිබඳ පළමුවන ප්‍රාදේශීය සහයෝගිතා රැස්වීම 2003 වර්ෂයේ බංගලාදේශයේ ඩකා හීදී පවත්වන ලදී. එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කරන ලද සහස්‍ර සංවර්ධන ඉලක්ක (MDGS) වලට අදාල සනීපාරක්ෂණ අවශ්‍යතා සපුරා ගැනීමේදී ඇති වන අභියෝග වලට විසඳුම් සෙවීම සඳහා සාකච්ඡා සහ බලපෑම් කිරීමේ වේදිකාවන් ලෙස සකොසාන් (SACOSAN IV) සලකනු ලැබේ. සකොසාන් (SACOSAN IV) 2011 අප්‍රියෙල් 4 - 8 දක්වා කොළඹදී පවත්වනු ලැබේ. සමුළුව සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමේ වගකීම අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සමන්විත අන්තර් ආයතන ජාතික මෙහෙයුම් කමිටුවක් මත පැවරේ.

**සනීපාරක්ෂාව**

සකොසාන් IV ට (SACOSAN) අදාළව කේන්ද්‍රීය කරුණු වන්නේ වැසිකිළියක් භාවිතා කිරීම, මිනිස් මළ ද්‍රව්‍ය ආරක්ෂාකාරීව ඉවත් කිරීම, සබන් ගා දෑත් සේදීම වේ. ලෝකය පුරා රෝගාබාධවලට ප්‍රධාන හේතුව සනීපාරක්ෂක පැවැත්මක් නොමැතිවීම සහ ආරක්ෂා සහිත සනීපාරක්ෂක පහසුකම් සහ සේවාවන් නොලැබීම බව ලෝක සෞඛ්‍ය සංවිධානය තීරණය කර ඇත. සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම ගෘහස්ථ වශයෙන් සහ ජන සමාජය වශයෙන් සැලකිය යුතු සෞඛ්‍ය සහ සමාජීය බලපෑම් ඇති කරන බව පෙනී ගොස් ඇත.

**පාර්ශවකරුවන් සංවිධානය කිරීමේ වැඩමුළු**

සමුළුව පිළිබඳව දැනුවත් වීම ප්‍රගුණ කිරීමට සහ අවශ්‍ය පරිදි සම්පත් හා සජීවීකරණය ඇතිකිරීමට කොළඹ දී සහ පළාත් මට්ටමින් වැඩමුළු මාලාවක් පවත්වනු ලැබේ. මෙහි





ඔවුන්ගේ දිවිපෙවෙත යහපත් කරගෙන වැසිකිළි ප්‍රයෝජනයට ගෙන අභිමානවත් වීමට 'සකොසාන් ' සමුළු මගින් හැකි වේ.

ගෝලීය වශයෙන් ග්‍රාමීය පෙදෙස් වැඩි දියුණු වු පානීය ජලය සහ සනීපාරක්‍ෂණ පහසුකම් ලබා ගැනිම පසුබෑමකට ලක් වී ඇත. අවම සනීපාරක්‍ෂක පහසුකම් නොමැති ජනතාවගෙන් දසදෙනෙකුගෙන් හත්දෙනෙකු ග්‍රාමීය වැසියන් වන අතර පානීය ජල සම්පත් නොලැබෙන දස දෙනෙකුගෙන් අටදෙනෙක් ආසියාවේ සහ අප්‍රිකාවේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. පානීය ජලය සහ සනීපාරක්‍ෂක අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාවන් පිළිබඳව වාර්තාවන් වඩා හොඳ වුවත් විවෘත ස්ථානවල මළපහකිරීම සම්පූර්ණයෙන් නැති කිරීම සඳහා මළ අපද්‍රව්‍ය ආරක්‍ෂා සහිතව ඉවත් කිරීම, පාසල් වල වැසිකිළි ඇතුළුව ප්‍රසිද්ධ වැසිකිළි සෑදීම  පිළිගත හැකි මට්ටමකට ගෙන ඒමේ අභියෝග දැනටමත් ඇත.

දකුණු ආසියාතික රටවල් වල සියලුම ග්‍රාමීය සහ නාගරික ජන සමූහයාට පූර්ණ වශයෙන් සහ කල් පවතින සනීපාරක්‍ෂාව කරා එළඹීමේ හැකියාව පමණක් නොව එය ලබාදීම ඔවුන්ගේ වටිනාකම ඉලක්කය බවට පෙර පැවති 'සකොසාන් ' (ඩකා - 2003, ඉස්ලාමාබාද් - 2006 සහ දිල්ලි - 2008) වලදී අවධාරණයෙන් ප්‍රකාශකරන ලදී. සුරක්ෂිත සනීපාරක්‍ෂාව සහ පානීය ජලය කරා ප්‍රවේශය මූලික අයිතිවාසිකමක් බවත් ඒ අනුව සනීපාරක්ෂාවට ජාතික වශයෙන් මූලිකත්වය ලබා දීම පැහැර හැරීය නොහැකි බවත් දිල්ලි ප්‍රකාශනය විසින් විශේෂයෙන් හඳුනාගන්නා ලදී. මෙමගින් දකුණු ආසියාවේ සියලුම සහභාගීත්ව රටවල් කාල නියමයන් සහිතව සනීපාරක්ෂාව සම්බන්ධ ජාතික සහ සහස්‍ර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම පිළිබඳ වගකීම සහතික කරති. දිල්ලි ප්‍රකාශනයේ සම්පූර්ණ පිටපතක් සංවිධාකයින්ගෙන් ලබාගත හැක.

**දකුණු ආසියාවේ ළඳරු මරණවලට මූලික හේතුව වශයෙන් පවතින්නේ පාචනයයි. දූර්වල සනීපාරක්‍ෂාව හා සම්බන්ධව අනාරක්ෂිත පානීය ජලය මෙම මරණවලින් 88% වගකිවයුතුවෙ. පවතින සීඝ්‍රතාවය අනුව 2015 දී ලබාගත යුතු ඉලක්කය දකුණු ආසියාවට ලබාගත හැකි වන්නේ ඉතා ප්‍රමාද වී 2043 - 2048 වර්ෂවලදී යන්න ඇස්තමේන්තු කොට ඇත.**

### සනීපාරක්ෂාව සඳහා වූ  සිවල් සමාජ සංවධාන

ජනතාවගේ ජල සහ සනීපාරක්ෂක අවශ්‍යතා සඳහා සහය දැක්වීමේ යෙදී සිටින සිවිල් සමාජ සංවිධාන මෙම ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයකි". දිල්ලි ප්‍රකාශනයෙන් වර්ෂයකට සහ සකොසාන් IV ට වර්ෂයකට පෙර Fresh Water Action Network South Asia (FANSA), Water Aid  සහ ජල සම්පාදන හා සනීපාරක්ෂක සහයෝගිතා සංගමය (WSSCC) විසින් 2008 දිල්ලියේදි පැවැත්වු සකොසාන් III සමුළුවේ දි  එකඟත්වය පළවු මාර්ග සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීමට  සිවිල්  සමාජ සාකච්චාවක්  2009 නොවැම්බර් මස මීගමුවේදි සංවිධානය කරන ලදි. සකොසාන්  IV සාකච්චාව සංවිධානය කිරීමේ කටයුතු වලටද සිවිල් සමාජ සංවිධාන නොකඩවා සහය දක්වති.







සනීපාරක්ෂාව සහ සුරක්ෂිත පානීය ජලය කරා ප්‍රවේශය මූලික අයිතිවාසිකමක් බවත් ඒ අනුව සනීපාරක්ෂාව මූලික අයිතිවාසිකමක් බවත් ඒ අනුව සනීපාරක්ෂාවට මූලිකත්වයක් ලබා දීම පැහැර හැරීමට නොහැකි බවත් දිල්ලි ප්‍රකාශනය මගින් හඳුනාගෙන තිබේ.



පළමුවැන්න පරිසර යුක්ති කේන්ද්‍රයේ සහ අනෙකුත් අයගේ සහයෝගිත්වයෙන් සකොසාන් ලේකම් කාර්යාලය සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබේ. අනෙකුත් වැඩමුළු සඳහා වෙනත් සිවිල් සමාජ සංවිධානවල සහාය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. පළාත් මට්ටමේ වැඩමුළු ඉදිරි මාස වලදී මහනුවර, අනුරාධපුරය, වව්නියාව, මඩකලපුව, මාතර සහ බදුල්ලේ දී පවත්වනු ලැබේ.

විශේෂයෙන් නගරබද කොටස් වල සනීපාරක්ෂක ඉලක්ක සපුරා ගැනීමේදී ජල සම්පාදන සහ ජලාපවාහන අමාත්‍යාංශය නියාමන කාර්යභාරය සිදුකරයි. ගම්බද කොටස්වල වෙනත් අය සහසම්බන්ධ වේ. සෞඛ්‍ය නිලධාරීන් යොදා ගෙන සනීපාරක්ෂක පහසුකම් වල තත්ත්වය නිරීක්ෂණය කරමින් සෞඛ්‍ය අමාත්‍යංශය නියාමන භූමිකාවක් රඟපායි. සෞඛ්‍ය අමාත්‍යංශයේ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයට ස්වස්ථතාවය පිළිබඳ දැනුවත් කිරීම  සහ සෞඛ්‍ය අධ්‍යාපනය ප්‍රචලිත කිරීමට වරම් ඇත. ප්‍රමාණවත්, අ ාරක්‍ෂා සහිත සනීපාරක්ෂක අවශ්‍යතා ජනයාට ලබා දීම සහතික කිරීම සම්බන්ධව පළාත් පාලන ආයතනවලට වැදගත් භූමිකාවක් ඇත. සනිපාරක්‍ෂක අංශ වල පාර්ශවකරුවන්ට ඔවුන්ගේ ප්‍රදේශ වල පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ පරතරය අවම කිරීම සඳහා ප්‍රශ්න මතුකර වගකීම් භාරගැනීමට මෙම වැඩමුළුව වේදිකාවක් වේ. ඊට අමතරව වැඩමුළුව පාරිසරික අංශයේ ප්‍රධාන පාර්ශවකරුවන් වන සහසම්බන්ධ අමාත්‍යාංශ, පළාත් පාලන අමාත්‍යාංශ, සිවිල් සමාජ සංවිධාන, පුද්ගලික අංශය සහ මාධ්‍යට සමුළුවේ අරමුණු පිළිබඳ කරුණු දැන ගැනීමට සහ ඔවුන්ට අදාළ භූමිකාවන් සහ වගකීම් ගැන සාකච්ඡා කිරීමට ද හැකියාව ලැබේ.

**පණිවුඩය**

- පුද්ගලික ස්වස්ථතාවය සහ සෞඛ්‍ය සම්පන්න පවුලක් සඳහා සනිපාරක්‍ෂාව මූලික වේ.
- සනීපාරක්‍ෂාව යනුවෙන් පොදු ප්‍රජාවගේ ආරක්ෂාව සඳහා සෞඛ්‍යමත් පරිසරයක් පවත්වාගෙන යාම වේ. වැඩි දියුණු කළ සනීපාරක්‍ෂාව යනුවෙන් අදහස් කරන්නේ 'පාරිසරිකව පිළිගත හැකි මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රමයක් ඇති වැසිකිළියක් පාවිච්චි කිරීම වේ.
- ප්‍රමාණවත් සනීපාරක්‍ෂාව යනුවෙන් අදහස් කරනුයේ " සෞඛ්‍යයට අහිතකර බලපෑම් අවම කිරීමට වැසිකිලියක් පාවිච්චි කිරීම "වේ.
- ලෝකයේ ඉතාම දිළිඳු පුරවැසියන්ගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීමට අභිමානය සහ කල්පවතින සමාජ සහ ආර්ථික සංවර්ධනය සහතික කිරීමට සනීපාරක්‍ෂාව සඳහා ප්‍රවේශ අත්‍යවශ්‍ය වේ.
- ජීවත් වන පරිසරය සහ භූ ජලය ආරක්‍ෂා කිරීම සඳහා මළද්‍රව්‍ය ඉවත් කළ හැකි ව්‍යුහයක් සහිත වැසිකිලියක් පරිහරණය කිරීම මගින් නිවැසියන්ගේ සනීපාරක්‍ෂාව සලසාගත හැක.
- පුද්ගලික ස්වස්ථතාවය සහ පවුල් සෞඛ්‍ය පවත්වාගෙන යාමට වැසිකිළි යාමෙන් පසු අත් සෝදා ගැනීම වැදගත් වේ.
- සනීපාරක්‍ෂාවේ කල් පැවැත්ම සඳහා සෞඛ්‍ය අධ්‍යයනය සහ හැසිරීම් රටාව වෙනස් කිරීම මුඛ්‍ය කරුණකි.

***The Delhi declaration, recognizes that access to Sanitation and Safe Drinking Water is a basic right, and accordingly that national priority to sanitation is imperative.***

**සකොසාන් කුමටද?**

පානිය ජලය සහ සුරක්‍ෂිත සනීපාරක්‍ෂාව එකම කාසියේ දෙපැත්ත වේ. සුරක්‍ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව මූලික අයිතිවාසිකමකි. පුද්ගලික සනීපාරක්ෂාව පවුල් සෞඛ්‍ය සහ නිවාස තුළ පිරිසිදු පරිසරයක් පවත්වා ගෙන යාම සඳහා මූලික වේ. ලෝක ජනගහණයෙන් 39% වන බිලියන 2.6 ක ජනගහණයට වැඩිදියුණු කළ සනීපාරක්‍ෂක පහසුකම් ලබාගත නොහැක. සනීපාරක්‍ෂාව සම්බන්ධයෙන් සහස්‍ර සංවර්ධන ඉලක්ක කරා ගමන් කර තිබෙන්නේ ඉතා කෙටි දුර ප්‍රමාණයකි. මෙම ප්‍රවනතාවය වෙනස් නොවී පැවතුනහොත් 2015 සඳහා වූ සනීපාරක්‍ෂක ඉලක්කයට බොහෝ රටවලට ළඟා විය නොහැකි  බව ලෝක සෞඛ්‍ය සංවිධානය කියා සිටී.



ආසියාවේ සහ අප්‍රිකාවේ ජනයාගෙන් බොහෝ දෙනා විවෘත ස්ථානවල මළපහ කිරීම නිසා රෝග පැතිරයාමේ සහ ජලය අපවිත්‍ර වීමේ විශාලතම අවධානම වේ. ලෝකය පුරා එළිමහන් ස්ථානවල මළපහ කිරීම අඩු වෙමින් පැවතුන ද දකුණු ආසියාවේ ජනගහණයෙන් 44% ක් පමණ එළිමහන් ස්ථානවල මළපහ කරන අතර දකුණු ආසියාවේ මිලිය 778 හෝ තුනෙන් දෙකොටසකටත් මෙම ක්‍රමය අනුගමනය කරයි. ශ්‍රී ලංකාවේ මෙම ගැටලුව අඩුවෙන් පැවතුනත් නිල සංඛ්‍යා ලේඛන නැත. එළිමහන් ස්ථානවල මළපහ කිරීමට පුරුදු වී සිටින ජනයා අතර අවබෝධයක් ඇති කර



**සමුළුව සඳහා ජාතික මෙහෙයුම් කමිටුව**

**සකොසාන් ලේකම් කාර්යාලය, ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, අංක 34, නාරාහේන්පිට පාර, නාවල .**

ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත්පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්‍ෂක ව්‍යාපෘතිය, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මොරටු විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, එක්සත් ජාතින්ගේ ළමා අරමුදල (UNICEF), ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකුව, ප්ලෑන් ජ්ත්‍යන්තරය, ප්‍රැක්ටිකල් ඇක්ෂන්, ශ්‍රී ලංකා ජල සහ සනීපාරක්ෂක අංශයේ සම්පත් මධ්‍යස්ථානය (SRIWASH) , ලංකා වැසි ජලය රැස්කරන්නන්ගේ සංගමය, බලශක්ති සංසදය සහ පරිසර යුක්ති කේන්ද්‍රය (CEJ).

# “සුවබර දිවියකට සනීපාරක්ෂාව”

---

**වැඩි විස්තර සදහා**

**කාර්යාලීය සමබන්ධතා** : ආනන්ද ජයවීර හෝ සුගන්ධි සමරසිංහ, දුරකථන/ෆැක්ස් : (+94)0112808165, ජංගම දුරකථන: 0777444544, සකොසාන් IV ලේකම් කාර්යාලය, ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, අංක 34, නාරාහේන්පිට පාර, නාවල , ශ්‍රී ලංකා - www.sacosan4lk.org

**සිවිල් සමාජ සම්බන්ධතා :** හේමන්ත විතානගේ, email: hemanthaw@eureka.lk, ජංගම දුරකථන : 0777600503, පරිසර යුක්ති කේන්ද්‍රය(CEJ), නො. 20/ ඒ , කුරුප්පු පාර , කොළඹ 08, ශ්‍රී ලංකාව - www.ejustice.lk

---

IV **වන සකොසාන් ජාතික වැඩමුළුව සදහා මුල්‍ය ආධාර සපයන්නෝ :**
ලෝක ළමා අරමුදල (UNICEF), Water Aid, ජල සම්පාදන හා සනීපාරක්ෂක සහයෝගිතා සංගමය (WSSCC), Fresh Water Action Network South Asia (FANSA), ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය, පරිසර යුක්ති කේන්ද්‍රය (CEJ).